## අපේ පැතුම!

පළමුව පායන තාරකාවට
මම කියමි, ප්‍රාර්ථනා කරමි
ලැබෙන  ලෙස අප සැමට
ලොවේ පවතින
සුන්දරම සුන්දරවූ
සන්තෘෂ්ඨිය....
අභිවෘද්ධිය.....
දයාබර වු සැමට
ආදරෙයි අප සැමදම
ලොව කුමක් කීවද?

ඇසෙන සැමවිටත්,
සිතෙන සැමවිටත්;
කෙරෙන සැමවිටත්
මතුවන්නේ....
ජීවිතයේ සුන්දරත්වයයි....!
නමුත්,
අසන සැමවිටත්
සිතන සැමවිටත්
කරන සැමවිටත්
මතුවන්නේ
ජීවිතයේ යථාර්ථයයි....
අපේ ජීවිතය
අපටත් ලොවටත්
පහනක්ම වේවා!
මැදහත් සිතින්
ලොව දෙස බැලීමට
අපට හැකිවේවා!

**සන්ධ්‍යා ප්‍රියදර්ශනී**
**සුරවීරආරච්චි**

## යළි හමුවූ....
## වෙන්ව ගිය නුඹ....

සිත ගිලන්ව අසරණ වූ....
හව් හරණක් ලගක නොවූ.....
කඳුලු බිඳක් නෙතක නොවූ....
දිනයක මා ලොව තනිවූ.....

නුඹ ලංවූවා මා හට
සිත ගිනි නිවුනා.....
හසරැලි නැගුනා මුවගට
සෙනෙහස දැනුනා.....

අතීතයේ ඈත ඉමක
නුඹ සෙනෙහස ලැබුන දිනක
යෞව්වනයේ සුන්දර බව
අත් විඳි සැටි මතකයි අද.....
නුඹේ හදිසි දුරස්වීම
සිතට දරා ගත නොහැකිව
ජීවිතයෙන් සමු ගැන්මට
වෙර දැරි සැටි මතකයි අද.....

සඳ පිබිදී තරු දිලිසී
නිල් අහසම ලස්සන වී....
දින ගෙවුනා මතකයි මට
නුඹ මා ලග නොහිදා.......

හිරු පිබිදී මල් හිනැහී
දවස ගෙවී කල් ගතවී......
යළි දවසක් මතු දිනදී
නුඹ හමු වී සිත පිබිදී.....
ලොව එළිය වුණා......
සිත් සතුටු උනා....

සුරංග

### නිහඬ විලාපය!

චුටි පුතු නැති සොවින්
හඬයි මව දරු පෙමින්
රැස්ව සිටි සියළු දෙන
ඇතිව කඳුලැති නයන
බැලූ අත බලාගෙන
ගොළුව සිටි එම දසුන
සති ගණන් ගත වුවත්
භූමරංගයක් මෙන්
යළි යළිත් පැමිණෙමින්
මගේ සිත රිදුම් දෙයි

**ගාමිණී ලක්ෂ්මන් ගමගේ**

# පහන් වැට

## වියෝගය

ජීවිතය අනියතැ'යි කියා කෙතරම් අසා ඇතුවත්
පුතේ, නුඹ මා හැර යන තුරුම දැනුණෙ නෑ එහි අරුත්
දරා ගන්නට බැරි එකම දුක දරු දුකදැ'යි මා නොදනිනත්
නුඹෙන් වෙන්වුන  ද දැනුණ දුක වදන් කරනට නෑ මා සමත්

නුඹේ අප්පච්චි ගලක් සේ හිඳ හදේ දුක් පිස දමන්නැ'ති මට හොරෙන්
පුංචි අක්කා නුඹේ දන්නෙ නෑ නුඹ ඇවිත් ගිහින් බව තවමත්
රෝහල් සයනයේදි දුටු නුඹේ සිතුවම අමතක නොවේ කිසි කාලෙකත්
විටින් විට කඳුලකින් රිදෙව්වේ ඒ මතකයයි හද කොනේ සැඟවී ගත්

මා කෙරූ පව කුමක්දැ'යි කියා දෙනවා නම් කවුරුහරි මට
යළිත් කිසි අත්භවෙක
ඒ දුක අත් නොවෙන්නට
කිසිකලෙක නුඹ එලෙස
මා වෙතින් නික්මී නොයන්නට
බුදුන් පාමුල වැටී
පුතේ;
නුඹ නමින් මම පින් පුරන්නද?

**චාන්දනී කුලතුංග**
නවසීලන්තය

## රනින් නෙළූ කුමාරියේ

රන් රූසිරියට පෙම් බැන්ද
මුළු හදින් ම මා
සඳ මුදුන් වුණා යහනේ
මුදු තෙපුළින් සිත් ගත්තා
මා  රනින් නෙළූ
රන් රූපෙට පණ දුන්නා
ඔබ පබාවතී කුමරි
හිරු රැසින් දැවී ගියා
දිවා කලේ මා ගත
ඔබ දුටු මොහොතේ කුමරී
බැන්ද සෙනේ පිදුවා
රණ ගොසින් තෙදින් ඔබ කැන්ද
ඔබේ සිතේ රුව නොදුටු වෙලේ
නෙතින් කඳුළු  ඉනූද
ඇත්හලේදි හිඳ වැයුවේ
හදවත පමණක් ඒ රන් රූපයේ
ගල් කුළකින් නෙළුවේ නෑ මා
යදිනට ඔබගෙ සෙනේහේ
දර දිය ඇදි ද
බහක් නොදුන්නේ කිම කුමරී
දුක් යහනේ සැතපී
දිනාගන්න ඔබ රජෙකු ලෙසින් මා
සිංහ නාදයෙන් මුසපත් වී
දෙපා පිදුම් දුන් පබාවතී
රන් රූපෙට කමාව දුන්නා
මගෙ පබාවතී කුමරී

**පුෂ්පිකා ගමගේ**
රොස්බර්ග් පාක්

### නැගණියේ...

වියෝ කඳුළින් නැහැවුණේ
පැතුම් සුන් විය අද දිනේ
බෙදගන්නට නුඹෙ සෙනේ
මවක් වෙයි නුඹ හෙට දිනේ

ගෙවා   ආ මග ජීවිතේ අඩුයි
වැඩි දුර යනු ඇතේ
තබා අදිටන නුඹෙ සිතේ
පෙරට යනු වරදිනු නැතේ

නොඅඩු සෙනෙහස නුඹ සතුයි
සිතුම් කරුණාවෙන් බරයි
මවු කිරුළ පළඳිනු හැකියි
ඉතින් නුඹ ලතවෙනු කිමැයි

ලංව නුඹ වෙත ආදරෙන්
කියමි නිතරම සිහි කරන්
නිවාගෙන දුක් ගිනි සිතෙන්
කිරුළ ගන්නට සැරසියන්

**චන්ද්‍රානි රාජකරුණා**
තෝමස්ටවුන්

## තනිකම

පුරවමි පත් ඉරුව මගෙ තනිකමට
එනමුත් හොඳ කවි පද ගැලුවා මගෙ හිතට
ලීවෙමි අදහස් ගලපා මම සීරුවට
දෙන්නෙමි පත් ඉරුව අද මම සන්නසට

තනිකම හුරුයි මට දැන් මේ ලෙසට
බැලුවෙමි පත්තර සඟරා එක දිගට
තනිකම මැකෙයි මට දැන් මේ හිතට
යැව්වෙමි මගෙ කවිය ඔබේ අතට

ගත සිත ඔබේ පිනවන්න
බාරයි කවිය ඔබ හට කියවන්න
කියවා බලා සිත මා සනසන්න
ලැබුවෙමි දිරිය පත් ඉරුව සරසන්න

**සීඩා මාටින්ස්ටයින්**
බොල්වින්

## තරු තනියම

නිවෙනවද - පායනවද
ඇයි හැංගෙන්නේ
අහසම කළුවරයිනේ
තනියම ආව එක හොඳයි
මම බලාගෙන හිටියේ
තනියම පායනකම්
දූත මෙහෙවරක යවන්න
නළ කුමරු - දමයන්තිගෙ
දූතයා වුණේ
හංසයිනේ.....
දන්නවද වැඩක්
පැතුමන් සුනු විසුණු කරලා
හිත හොඳටම රවට්ටවලා
ප්‍රශ්ණයකින් පැන ගිහිල්ලා
අසපුවෙ සිල් බිඳ දමාලා
රහසින් කණ ළඟට ගිහින්
දුක දැනෙනවද අහන්න
මතකයෙ ඉන්නවදත් අහන්න
හිත උඩුකුරු යටිකුරු කෙරුවට
එළිපිට නොකිව්වට
පුංචි තිතක් -
සරල රේඛාවක් වගේ
සිත නම් රාජධානියේ
සඟවලා තියෙන බවත්;
මම දන්න බවත්
පැහැදිලි කරලා දීලා
මතකය අවදි කරලා
පොඩ්ඩක් රිද්දවලා
ඉර පායන්න කලින්
හැකි තරම් වේගයෙන්
සඳ අරා වැඩ ඉන්න
තරු කුමරිට අහු නොවෙන්න
සුභ ගමනක් ගිහින් එන්න!

**කාන්ති වික්‍රමසූරිය**
ලංකාවේදී

## බුදුවර අසපුව

සිහිල් සුළඟ  - හමන මදනල
හද කිති කවයි- මගේ සිත ළඟ
පහන් වැට අද්දර - තෙල් නොමැති
පහන
දෙස් දෙවොල් තියයි -
තොර තෝංචියක් නැතිව මට

ඇදුනෙමි එපිට - මල් ආසනේ ළඟට
හද කකියවයි හැමවිට
නැත එක මලක්වත් -
ඒ බුදුන් අභියස

බිම  වැටුණු සේපාලිකා මල්
බිම් මායිමේ පන්සලේ
කෑ ගසයි මොර දී
ආතක් පාතක් නැති ගාණට

කිසිම  හැල හොල්මනක් නැති
බුදුගේ ඇතුළ
හරිම පාළුයි- කාන්සිය නිවන
ඉඳහිට පියාඹන වවුලා සමග
කතාබස් නොකරම
පිං පෙට්ටියට පඬුරක් දමා
එළියට පය තැබුවෙමි
බෝධීන් වහන්සේ ළඟට යාමට

කාලෙකින් අතු නොගාපු
බෝධියේ පොළෝවට
මැලවුණු බෝකොළ මත
පය තැබුවෙමි චිරි චිරි හඬ සමග

ආවාසෙ ළඟට මා
ඇදුණු විට දැකගත්තෙ
අඩවන් කළ දෙර ලෑල්ල පමණි
කිසිවෙකු නැති ගාන
විපරම් කලා මගේ හිතම
ලොකු හාමුදුරුවෝ

පිටුපසින්  ආ සද්දේ සමග
විගස හැරුණෙමි ආපස්ස
බිමට බරවුණ ඇබිත්තයාගේ
දෑස කියයි
හදවත කකියවන පුවත මට

ලොකු හාමුදුරුවන් අපවත් වී
මාස ගණනක් ගියාට
නැත වැඩියේ එහා ගමෙන්
පොඩි හාමුදුරුවො නමක් තාම

**නිලාන් මාගම්පිටිය**
සිඩ්න්හැම්

## නාලනී එන්න මල් පිපීලාදැයි බලන්න

වසන්තය උදාවී මෙල්බර්න් නුවරට
මලින් බරව ඇත සියළු ගහකොළ
එත් නුඹ ජීවිතය පටලවාගෙන දුවන
මල් දකී - නොදැක මලේ ලස්සන.

හෝඩියේ මා එක්ක - අකුරු කිව් නාලනී
වයස විසි ගණන්වල මෙතෙර ආ නාලනී
කළුකිරුණිද සසර - විඳවන්න වූ විට
විඳින්නට හිතාගෙන ආ ජීවිතය ?

මලින් උතුරන විට සමන්පිච්ච වැල
මල් සුවඳ සමඟ යන්නෙමි අතීතෙට.
මතකයිද නුඹට මල් වට්ටි හැදූව හැටි
දහම් පාසැලේ ලකුණු දහය ගන්නට ?

නොවිඳිනා දුක්විඳ ඉගැන්වූ දරුවන්
ඉගිල ගොස් කැදැල්ලෙන් ඉක්මණින්ම.
අරුමයක් නොවේ මල් සුවඳ නොදැනීම
හදවතින් හඬා වැටෙනා නුඹට.

බුදු සරණ සොයා පටාචාරා මෙන්
රෑ දවල් නොතකා දුවයි නුඹ.
වසර විස්සක් දුවපු විදියට
කෙටි මගක් සොයමින් නිවනටද.

අනියත බව නම් ඇත්තයි සසර
එත් - දුලබ නේද මිනිසත් බව ?
අපට තව කල් තියේ විඳින්නට ජීවිතය
තාම අපි ඉන්නේ හතලිස් ගණන්වල.

ගිම්හාන රකුසා දත් විලිස්සන්න පෙර
බණ පොත පසෙක ලා එකම එක දවසකට
හෝඩි පොතේ අප කියවූ විදියට
නාලනී එන්න මල් පිපීලාදැයි බලන්න!

**ශ්‍රියානි පෙරේරා**
සවුත්බෑන්ක්

පසුවදන:
වින්දනය සිඳී ගොස් විඩාවූ ජීවිතය
දනිමි ඇය නොකියවන බව අපේ කවි පිටුව.
නාලනීලා සිටී රටපුරාමත් විසිර
රසිකයිනි ඔවුන්හට දෙන්න මේ පණිවිඩය.

## ජීවිතය

ජීවිතය පැන වැලකි
දෛනිකව පිළිතුරු ලියන
සමහරෙක් ජය ගනිති
සමහරෙක් පසු බසිති

බුදු පියාණන් පෙන්වා දුන්
'මම' යන්නේ
අරුත් සුන් බව හැඳින
නිහඬවම දිවි ගෙවමි

ජීවිත යථාර්ථය
උපේක්ෂාවෙන් බලා
නිවැරදි වූ උත්සාහය
ඒ සඳහා එක් කරන්

**කාන්ති ජයසිංහ**
තෝමස්ටවුන්

### අම්මා

මගෙ සුදු  අම්මා
මටකිරි දීලා
මා උස් මහත් කළා
මගෙ ඒ අම්මා
අද මා හැරදා
දෙව්ලොව ගිහින් සද
දෙපා නමැද මා ඔබගෙන් ඉල්ලමි
සැමද වෙන්න සමා
පියවි ඇසට මට පෙනුණේ නැතිවත්
ඔබ මා ළඟ ඉන්නා බව නම්
හොඳ හැටි දනිමි මෙමා
අම්මේ ඔබහට ණය ගැති වන්නෙමි
මගෙ මුළු දිවිය පුරා

**මල්ලිකා නාත්තන්ඩිගේ**